සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2022 ජනවාරි

## (202) අංකිත (ඩිජිටල්) පරිසරයේ තොරතුරු පද්ධති

(Information Systems in Digital Environment)

2022-03-20
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්**, ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** දත්ත සම්බන්ධයෙන් වන නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) දත්ත ලබාගන්නේ තොරතුරුවලින් ය.

(2) ඕනෑම නිශ්චිත අවශ්‍යතාවයක් ඉටුකිරීමට දත්ත සැලසුම් කරයි.

(3) දත්ත යනු මූලික අර්ථ නොගැන්වූ කරුණු (facts) සහ සංඛ්‍යා (figures) වේ.

(4) දත්ත යනු සැකසූ තොරතුරුවල ප්‍රතිඵලයකි.

1.2 "ගුගල් පත් (Google Sheets)" සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ සලකා බලන්න:

**(a)** එය පැතුරුම්පත් (spreadsheets) මත වැඩ කිරීම සඳහා භාවිතකරන යෙදුමකි.

**(b)** එය සාමාන්‍යයෙන් අන්තර්ජාල සම්බන්ධතාවයක් සමඟ භාවිත වේ.

**(c)** ගෙවීමකින් තොරව පවා එම සේවාව භාවිත කළ හැකිය.

**(d)** මයික්‍රොසොෆ්ට් (Microsoft) සමාගම විසින් එය සංවර්ධනය කර ඇත.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(b)** සහ **(c)** පමණි.
(2) **(a), (b)** සහ **(d)** පමණි.
(3) **(a), (b)** සහ **(c)** පමණි.
(4) **(b), (c)** සහ **(d)** පමණි.

1.3 සිසුවෙකුට නිවසේ සිට අධ්‍යාපන කටයුතු සිදුකිරීම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවයක් මිලදී ගැනීම සඳහා තිබෙන පහත තාක්ෂණයන් සලකා බලන්න:

**(a)** ප්‍රකාශ තන්තු (Optical Fiber).

**(b)** අසමමිතික ඩිජිටල් ග්‍රාහක සම්බන්ධතාවය (Asymmetric Digital Subscriber Line).

**(c)** ඒකාබද්ධ සේවා ඩිජිටල් ජාලය (Integrated Services Digital Network).

**(d)** 5G.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවසේ සිට අධ්‍යාපන කටයුතු සිදුකිරීමට ශ්‍රී ලංකාව තුළ දැනට පවතින තාක්ෂණයන් මොනවාද?

(1) **(a)** සහ **(b)** පමණි.
(2) **(a), (b)** සහ **(c)** පමණි.
(3) **(a), (b)** සහ **(d)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.


1.4 ජංගම බැංකුකරණය (Mobile Banking), ජංගම ටිකට්පත් (Mobile Ticketing) සහ ජංගම සාප්පු සවාරි (Mobile Shopping) වැනි යෙදුම් සමූහයක් විස්තර කිරීම සඳහා භාවිත කළ හැකි යෙදුම (term) වන්නේ:

(1) ජංගම වාණිජ්‍යය (M-Commerce).
(2) ක්‍රිප්ටො මුදල් (Cryptocurrencies).
(3) ජංගම මුදල් (M-Cash).
(4) ඩිජිටල් මුදල් (Digital Cash).

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, තොරතුරු විත්‍රණයක් (infographic) සඳහා උදාහරණයක් **නොවන්නේ** කුමක් ද?

(1) ප්‍රවාහ සටහන (Flow Diagram).
(2) සිතියම (Map).
(3) ජාල රේඛය (Histogram).
(4) ස්මාට් නිවාස (Smart House).

**1.6** දත්ත දෘශ්‍යකරණ (data visualisation) ක්‍රමයක් ලෙස භාවිත කරනු ලබන ප්‍රස්තාරයක්, පහත රූපසටහන මගින් නිදර්ශනය කරයි:




ඉහත ප්‍රස්තාරය:

(1) බුබුලු සටහනකි (Bubble Chart).
(2) රේඩාර් සටහනකි (Radar Chart).
(3) රේඛා සටහනකි (Line Chart).
(4) විසිරිතිත් සටහනකි (Scatter Diagram).

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, ගුප්ත මුදල් (Cryptocurrency) සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) බ්ලොක් දාමය (Blockchain).
(2) බිට්කොයින් (Bitcoin).
(3) මූල්‍ය තාක්ෂණය (Fintech).
(4) සමූහ අරමුදල් (Crowd-funding).

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, මාර්ගගත (online) ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ දිශානතියේ පියවරක් **නොවන්නේ** කුමක් ද?

(1) සහාය නොදක්වන (යල්පැනගිය) මෘදුකාංග භාවිතයෙන් ඉවත්වීම.
(2) යාවත්කාලීන කළ ප්‍රතිවයිරස මෘදුකාංගයක් (anti-virus software) ක්‍රියාත්මක කිරීම.
(3) ශක්තිමත් මුරපද (passwords) භාවිතය.
(4) දත්ත නැතිවීම ආවරණය කිරීම සඳහා රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීම.

**1.9** වර්තමානයේ පරිගණක උපාංගවල (devices) බලශක්ති පරිභෝජනය පිළිබඳව සංවිධානයන් විශාල සැලකිල්ලක් දක්වයි. පහත සඳහන් ඒවා අතුරෙන්, සේවාදායක පරිගණක (servers) සම්බන්ධයෙන් මෙම ගැටළුව අවම කිරීම අරමුණු කරගත් උපායමාර්ගයක් වන්නේ කුමක් ද?

(1) දත්ත ගුප්තනය (Data Encryption).
(2) අථත්‍යකරණ තාක්ෂණයන් (Virtualisation Techniques) භාවිතය.
(3) බ්ලොක්දාම (Blockchain) තාක්ෂණයන් භාවිතය.
(4) පරිගණක ප්‍රතිචක්‍රීයකරණය (Recycle Computers).

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, නිත්‍යානුකූලව අරමුදල් පිළිගැනීම සඳහා වන මාර්ගගත ගෙවීම් (online payment) ක්‍රමයකට උදාහරණයක් **නොවන්නේ** කුමක් ද?

(1) Amazon Pay. (2) Linux. (3) Payhere. (4) PayPal.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 20)

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** විද්‍යුත් වාණිජ්‍යය (E-commerce) තුළින් පාරිභෝගිකයන්ට කාලය හෝ දුර පිළිබඳ බාධාවකින් තොරව භාණ්ඩ හා සේවා විද්‍යුත් මාර්ගයෙන් හුවමාරුවට ඉඩ සලසයි.

**1.12** ඇමේසොන් (Amazon) S3 සේවාව, සරල ගබඩාකරණ සේවාවක් සඳහා උදාහරණයකි.

**1.13** 2017 අංක 25 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන) පනත, තොරතුරු තාක්ෂණය සහ තොරතුරු පද්ධති සම්බන්ධ නෛතික පනතයි.

**1.14** MOOC, සමූහ අරමුදල් (crowd-funding) සඳහා උදාහරණයකි.

**1.15** තොරතුරු පද්ධති විගණනයක් මඟින් සඵලදායි මෙහෙයුම් සහතික කිරීමට සහ පරිපාලනය හා නීතිමය රෙගුලාසි තහවුරු කිරීමට ව්‍යවසායෙකුට උපකාර කළ හැකිය. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### **02** වන ප්‍රශ්නය

(a) තොරතුරු පද්ධතියක් යනු ආයතනයකට අවශ්‍ය තොරතුරු සහ සන්නිවේදන සේවා සපයන පද්ධතියකි. එහි මූලිකාංග (elements) කිහිපයක් ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) තොරතුරු පද්ධතියක මූලිකාංග විදහා දැක්වීම සඳහා රූප සටහනක් (diagram) **අඳින්න**. (ලකුණු 05)

(ii) තොරතුරු පද්ධතියක ක්‍රියාකාරකම් (activities) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) ව්‍යාපාර ක්‍රියාවලියක් යනු සෘජුව හෝ වක්‍රව පාරිභෝගිකයන් මත බලපෑම් එල්ල කරන්නාවූ ක්‍රියාකාරකමක් හෝ ක්‍රියාකාරකම්වල එකතුවකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති-ඉංජිනේරුකරණය [Business Process Re-engineering (BPR)] යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

මෑතකදී ස්ථාපනය කරන ලද ගිණුම්කරණ ආයතනයක් පහත සඳහන් පරිදි ඔවුන්ගේ අවශ්‍යතා මත පදනම්ව විවිධ අරමුණු සඳහා යෙදුම් මෘදුකාංග (application software) තෝරාගැනීමට සැලසුම් කරයි:

(a) මයික්‍රොසොෆ්ට් එක්සෙල් සඳහා විකල්පයක් ලෙස වලාකුළු මත පදනම් වූ සේවාවක් ලෙස මෘදුකාංගයක් (An alternative cloud-based SaaS for Microsoft Excel).

(b) මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් සඳහා විකල්පයක් ලෙස වලාකුළු මත පදනම් වූ සේවාවක් ලෙස මෘදුකාංගයක් (An alternative cloud-based SaaS for Microsoft Power Point).

(c) මයික්‍රොසොෆ්ට් වර්ඩ් සඳහා විකල්පයක් ලෙස වලාකුළු මත පදනම් වූ සේවාවක් ලෙස මෘදුකාංගයක් (An alternative cloud-based SaaS for Microsoft Word).

(d) දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංගයක් (A Database Management System Software).

(e) ඩෙස්ක්ටොප් ප්‍රකාශන මෘදුකාංගයක් (A Desktop Publishing Software).

(f) මයික්‍රොසොෆ්ට් හෝ ගූගල් හැර වෙනත් වෙබ් බ්‍රවුසරයක් (A Web browser except for Microsoft or Google).

(g) ෆේස්බුක් හි පළකරන ලද ඡායාරූප සංස්කරණය කිරීම සඳහා ඡායාරූප සංස්කරණ මෘදුකාංගයක් (A photo editing software for editing Facebook posted photos).

(h) පරිශීලකයන් 99 කට වැඩි සංඛ්‍යාවක් සහභාගි වී වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා මෘදුකාංගයක් (A software to setup video conferences for more than 99 users).

(i) ගිණුම්කරණ මෘදුකාංගයක් (An Accounting Software).

**ඔබ විසින් කළ යුතු දෑ:**

දැනට වෙළෙඳපොලේ ඇති ඉහත එක් එක් අවශ්‍යතා සඳහා සුදුසු මෘදුකාංගයක් (software) **හඳුනා දක්වන්න**. (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

විවිධ තොරතුරු පද්ධති මගින් සපයනු ලබන තොරතුරුවල ගතිලක්ෂණ (characteristics) විවිධ කළමනාකරණ මට්ටම්වලදී වෙනස්විය හැක.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් තොරතුරුවල ගතිලක්ෂණ යටතේ, මෙහෙයුම් කළමනාකරණ මට්ටම, උපායමාර්ගික කළමනාකරණ මට්ටමෙන් **වෙනස්කොට දක්වන්න**:

- කාල සීමාව (Time period).
- කාලානුරූපී බව (Timeliness).
- නිවැරදි බව (Accuracy).
- නිශ්චිත බව (Certainty).
- සම්පූර්ණ බව (Completeness). (ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(a) ව්‍යාපාර බුද්ධිය (Business Intelligence) සහ ව්‍යාපාර විශ්ලේෂණය (දත්ත විශ්ලේෂණය) [Business Analytics (Data Analytics)], ව්‍යවසායික මෘදුකාංග අංශයේ වේගයෙන්ම වර්ධනය වන වෙළෙඳ පොළවල් ලෙස සැලකේ. "ව්‍යාපාර විශ්ලේෂණය" සහ "ව්‍යාපාර බුද්ධිය" යන යෙදුම් බොහෝ විට සම අරුතින් භාවිත වේ. එනමුත්, ඒවා අතර ප්‍රධාන වෙනස්කම් තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ව්‍යාපාර විශ්ලේෂණය සහ ව්‍යාපාර බුද්ධිය අතර ඇති වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ආයතන තුළට තොරතුරු තාක්ෂණ සක්‍රිය පද්ධති (IT enabled systems) පැමිණීමත් සමග ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රකරණ [Business Processes Outsourcing (BPO)] ක්‍රියාකාරකම් පසුගිය කාලය තුළ පුළුල් වී ඇත. BPO සේවා සැපයීමේ අරමුණ සඳහා පමණක් පිහිටුවා ඇති විශේෂිත ආයතන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) BPO අංශයේ නියැලී සිටින සමාගම් විසින් සපයනු ලබන විවිධ සේවා වර්ග තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(ii) BPO හි අවාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

තාක්ෂණය භාවිත කිරීමේ ප්‍රතිලාභ රැසක් පවතී. වඩා හොඳ සහ වේගවත් තොරතුරු හුවමාරු කර ගැනීමකට ඉඩ සලසන තාක්ෂණය, ආයතන මඟින් සපයනු ලබන සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීමට දායක වේ. කෙසේවෙතත්, පරිසරයට තාක්ෂණයෙන් සැලකිය යුතු බලපෑමක් එල්ල වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) (i) "හරිත පරිගණකගතකරණය" (Green Computing) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(ii) සංවිධානයක් විසින් හරිත පරිගණකගතකරණයට අනුගත වීම සඳහා හේතුවන සාධක දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) "වලාකුළු පරිගණකගතකරණයේ (Cloud Computing) ආගමනය තුළින් පරිසරයට අහිතකර බලපෑමක් ඇතිවේ".

ඔබගේ උත්තරය සාධාරණීකරණය කරමින්, ඉහත ප්‍රකාශය සමඟ ඔබට එකඟවිය හැකිද යන්න **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) විද්‍යුත් අපද්‍රව්‍ය (E-waste) මඟින් පරිසරයට වන බලපෑම අවම කරන බව තහවුරු කිරීමට තොරතුරු තාක්ෂණය සක්‍රිය කාර්යාල පරිසරයක් තුළ කළහැකි කාර්යයන් (tasks) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**ලංකා ෆර්ටිලයිසර්** යනු මෑතකදී සංස්ථාපනය කරන ලද සමාගමකි. වතු සමාගම් වැනි විශාල වගාකරුවන්ගේ සිට ගෘහස්ත වගාකරුවන් දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයන් ඉලක්ක කර ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කර විකිණීමට එම ආයතනය සැලසුම් කරයි.

හම්බන්තොට සහ පුත්තලම යන ප්‍රදේශවල කාබනික පොහොර නිෂ්පාදන කම්හල් දෙකක් පිහිටුවීමට සමාගම සැලසුම්කර ඇත. ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකටම බෙදාහැරීමේ මධ්‍යස්ථාන ස්ථානගත කිරීමටද ආයතනය සැලසුම්කර ඇත. බෙදාහැරීමේ හවුල්කරුවෙකුගේ සහාය ඇතිව, සමාගම කාබනික පොහොර දිවයින පුරා බෙදාහැරීමට සැලසුම් කරයි.

පරිභෝජනයට සම්බන්ධ එළවළු සහ පළතුරු සඳහා පමණක් නොව, වාණිජ බෝග සහ නැවත වන වගා (re-forestation) විසඳුම් සඳහා ද ඔවුන්ගේ නිෂ්පාදිත කළඹ පුළුල් කිරීමටද කළමනාකාරිත්වය උනන්දුවක් දක්වයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කඩදාසි රහිත ඇණවුම් සැකසුම් පද්ධතියක් (paper-less order processing system) සඳහා සමාගමට අනුගමනය කළ හැකි තොරතුරු තාක්ෂණ උපායමාර්ගයක් **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සමාගමට ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ උපායමාර්ගයට සහාය ලබාගැනීම සඳහා වෙබ් අඩවියක් ක්‍රියාත්මක කිරීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) ඉහත (a) සහ (b) හි සඳහන් කර ඇති උපායමාර්ග ඉටුකර ගැනීම සඳහා සමාගමට ආයෝජනය කිරීමට සිදුවිය හැකි තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහයේ (IT infrastructure) සංරචක (components) හතරක්(04) **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(d) සමාගමට ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ උපායමාර්ගය සඳහා ජංගම යෙදුමක් (mobile app) ක්‍රියාත්මක කිරීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(e) සමාගමට ඔවුන්ගේ ප්‍රතිලාභ සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම කළ හැකි ක්‍රම තුනක්(03) **පැහැදිලි කරන්න**.
(ලකුණු 06)
(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |